පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

සතිය- 4 සතිය

10 ශ්‍රේණිය

Prepared by- දෙහිඕවිට අධ්‍යාපන කලාපය

**පෙර වර්ෂ වලදී ඔබ උගත් "නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූවන් " පාඩම් ද ඇසුරු කර ගනිමින් පහත ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.**

1) 6, 7, 8, 9 ශ්‍රේණිවල දී ඔබ උගත් නර්තන ශිල්පීන්ගේ නම් පහත වගුව අනුව වගු ගත කරන්න.

| උඩරට නර්තනයේ ප්‍රවර්ධනයට දායකවූවෝ | පහතරට නර්තනයේ ප්‍රවර්ධනයට දායකවූවෝ | සබරගමු නර්තනයේ ප්‍රවර්ධනයට දායකවූවෝ |
|---|---|---|
| | | |

2) පහත සඳහන් නර්තන ශිල්පීන්ගේ සුවිශේෂ නර්තන කුසලතා සහ නර්තන කලාවේ ප්‍රවර්ධනයට ලැබුණු දායකත්වය පිළිබඳ විස්තර කරන්න.
   - ❖ ඇස්. පණිභාරත මහතා
   - ❖ කේ.ඇස්. ප්‍රනාන්දු මහතා
   - ❖ ඩී.වී. හීන්නිලමේ මහතා

3) පහත සඳහන් ඡායා රූපය හොඳින් අධ්‍යයනය කරන්න.

මේ ඔබ දකින්නේ දේශීය නර්තන කලාවට මෙන්ම භරත නාට්‍යයම් නර්තන සම්ප්‍රදායට ද එක සේ දක්ෂතා දැක්වූ නර්තන ශිල්පිනියකි. පාසල් අධ්‍යාපනය තුළ නර්තන විෂයට ඉමහත් සේවයක් සිදු කළ ඇය නමින් මිරන්ඩා හේමලතා මහත්මියයි.

4) පෙර වර්ෂ වලදී ඔබ නර්තන ශිල්පීන් පිළිබඳ තොරතුරු ගවේෂණය කළ දැනුමද පදනම් කර ගනිමින් පහත සඳහන් සිරස්තල ඔස්සේ මිරන්ඩා හේමලතා මහත්මිය පිළිබඳ තොරතුරු රැස් කරන්න.
   - I. ජීවන තොරතුරු
   - II. දක්ෂතා දැක්වූ ක්ෂේත්‍ර
   - III. දැරූ තනතුරු සහ ආයතන
   - IV. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නර්තන විෂය ප්‍රවර්ධනයට සිදු කළ සේවය
   - V. නර්තන කලාව පිළිබඳ රචනා කළ ග්‍රන්ථ, නිර්මාණය කළ නර්තනාංග පැවැත්වූ නර්තන ප්‍රසංග
   - VI. හිමිකර ගත් සම්මාන